රිදිමාලියද්ද ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රිදිමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ විවිධ යන්ත්‍ර උපකරණ 07 කින් සපයන ලද සේවා වෙනුවෙන් ලැබිය යුතු ආදායම් රු.597,420 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය කර ගත යුතු සභික දීමනා රු.600,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

(ආ) <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.77,539,502 ක වත්කම් විෂයයන් 03 ක් ඔප්පු, පිඹුරුපත්, පැවරුම් නියෝග, තොග සමීක්ෂණ වාර්තා හා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | විගණනයට අදාල වන සාක්ෂි ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | සභාව සතු වත්කම් හඳුනා ගැනීමට සහ එසේ හඳුනා ගැනීමෙන් අනතුරුව තක්සේරුකර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

1.4 <u>අනුකූල නොවීම</u>
<u>නීති, රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

| නීති, රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ</u> | | | |
| (i) 47,49(අ) වගන්ති | සමාලෝචිත වර්ෂයේ සභා අනුමැතියෙන් තොරව ගොඩනැඟිලි 13 ක් ඉදිකර තිබුණි. | ගොඩනැඟිලි ඉදිකිරිම සඳහා සභාවේ අනුමැතිය ලබාගත යුතුවේ. | අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා විෂය නිලධාරින් දැනුවත් කර ඇත. |
| (ii) 159(1) වගන්තිය | හිඟ ආදායම් රු.3,398,317 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට විෂය නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |
| (iii) 217 වගන්තිය | සභාව ප්‍රයෝජනයට ගන්නා හා සභාවට අයත් සියලුම ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ විස්තර ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගොඩනැඟිලි පිළිබඳ වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතුවේ. | විෂය නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,822,307 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,096,771 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට යහිහ මුළු | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 මුළු දිනට හිහය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | අක්කර බදු | 1,000 | 1,000 | 576 | 424 | ,450 | 450 | - | 450 |
| (ii) | කුලී | 1,515,000 | 1,515,000 | 832,807 | 682,193 | 206,065 | 206,065 | 73,697 | 132,368 |
| (iii) | ව්‍යාපාර බදු | 350,000 | 350,000 | 350,000 | - | 3,000 | 3,000 | - | - |
| (iv) | වෙනත් ආදායම් | 3,873,711 | 3,873,711 | 1,158,011 | 2,715,700 | 666,975 | 666,975 | 455,875 | 211,100 |
| | එකතුව | 5,739,711 | 5,739,711 | 2,341,394 | 3,398,317 | 876,040 | 876,490 | 529,572 | 343,918 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල් කරනලද රු.5,739,711 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසානය වනවිට රු.3,398,317 ක් අයකර ගෙන නොතිබුණු අතර,එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 59 ක් විය. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | අපේක්ෂිත මට්ටම් ළඟා කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරමි. |
| වසර 05 කට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.4,577,685 ක් සහ හිඟහිටි කඩකුලී රු.420,782 ක් ලෙසට එකතුව රු.4,998,467 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් කඩිනමින් අය කරගත යුතුවේ. | තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසු විධිමත් ක්‍රියාපටිපාටියකට අනුව කටයුතු කරන ලෙස විෂය නිලධාරින්ට උපදෙස් දුනිමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.1,897,708 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් එකතු කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ආදායම් පරිපාලක මහතාට උපදෙස් දී ඇත. |

(ආ) <u>මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තු රු.1,804,613 අයකර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් එකතු කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ආදායම් පරිපාලක මහතාට උපදෙස් දී ඇත. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 06 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන හෝ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | රථ වාහන නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. |

(ආ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | විෂය නිලධාරින්ට උපදෙස් දී ඇත. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | මේ සම්බන්ධව කටයුතු කරන ලෙස විෂය නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 01 කට අදාලව එක් අතිරික්තයක් විය. | කාර්ය මණ්ඩලය අනුමත කරගත යුතුවේ | පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 02 කට අදාලව පුරප්පාඩු 06 ක් පුරවා විය. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

3.3 <u>ප්‍රසම්පාදනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | විෂය නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

3.4 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදාඋල්පත පොල භූමිය වෙළද අයිතිය බදුදීමේ ගිවිසුමේ කොන්දේසි 04 අනුව කටයුතු සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.833,746 ක ආදායමක් අය කරගෙන නොතිබුණි. | හිඟ පොල බදු ආදායම් අයකර ගත යුතුවේ. | අධිකරණයේ නඩු පවරා ඇති බව දක්වා ඇත. |
| (ආ) | වසර 5 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණයහිමි රු.136,494 ක්, කර්මාන්ත ණයහිමි රු.9,799,856 ක් සහ වෙනත් වියදම් ණයහිමි රු.3,104,365 ක් ලෙස එකතුව රු.13,040,715 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසු විධිමත් ක්‍රියාපටිපාටියකට අනුව කටයුතු කරන ලෙස විෂය නිලධාරින්ට උපදෙස් දුනිමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛ අංක ඩීඑම්ඒ/2009(01)දරන 2009 ජුනි 09 දිනැති චක්‍ර ලේඛය අනුව කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද,සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 03 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඒකාබද්ධ කර පැවැත්වූ කමිටු වලට සහභාගී වී ඇත. |